**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I) - 2021**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර I) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක 47037- එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

---

වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොතට අනුව, බලශක්ති අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ පිවිතුරු විදුලිබල ජනනය, පද්ධති කාර්යක්ෂමතාව හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීම වේ. ජල විදුලි ජනනය සංවර්ධනය සහ විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම, සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම, මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා ඉල්ලුම් කළමනාකරණය, ධාරිතා සංවර්ධන සහාය සැපයීම යන සංරචක 5 කින් වැඩසටහනේ කටයුතු සමන්විත වේ. පහසුකම් පරිපාලන අත්පොතට අනුව, වැඩසටහනේ අස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 28,509.80 කට සමාන එජඩො මිලියන 220 ක් වන අතර, ඉන් රු. මිලියන 23,326.20 කට සමාන එජඩො මිලියන 180 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව හා Agence Francaise De Development එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 5,183.60 ක් මූල්‍යනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කටයුතු 2015 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 ජූලි තෙක් දිර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 යටතේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2021 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ව්‍යාපෘති වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදි. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමකට ලක්කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධනිත කරන ලද වාහන 51කට අදාළව 2021 දෙසැම්බර් 31 දින දක්වා කරන ලද රු. මිලියන 138.7 ක් වූ ක්ෂයවීම්, ක්ෂය සඳහා ප්‍රතිපාදන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ලංවිම ප්‍රාග්ධන දායකත්වය ලෙස ගිණුම්ගත කර තිබුණි. | 138.7 | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් වෙනම හෙළිදරව්වක් කර ඇත. | ක්ෂයවීම් සඳහා සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් යොදා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වාහනවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 7 සිට 14 දක්වා වෙනස් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ 1 වන කොටසේ වාහන 42 න් වාහන 19 ක් සම්බන්ධ ක්ෂයවීම් වසර 7 ක ඇස්තමේන්තුගත ආයු කාලය මත පදනම්ව ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂයවීම රු. මිලියන 16.6 කින් වැඩි වී තිබුණි. | 16.6 | සටහන් කර ගන්නා ලද අතර වැරැද්ද 2022 දී නිවැරදි කර ඇත. | වාහනවල නව ප්‍රයෝජනවත් ආයු කාලය ක්ෂය ගණනය සඳහා යොදා ගත යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව ව්‍යාපෘතියේ 2 කොටසට අයත් වාහන 04 ක් 1 කොටසේ වත්කම් ලෙසත් ව්‍යාපෘතියේ 1 කොටසට අයත් වාහන 42 ක් 2 කොටසේ වත්කම් ලෙසත් හඳුනාගෙන තිබුණි. | - | සටහන් අංක 4.01 හි ශීර්ෂය යතුරු ලියන දෝෂයක් හේතුවෙන් 1 වන කොටස, මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය ලෙස වැරදි ලෙස දක්වා ඇති අතර එය 1 වන අදියර, 2 වන කොටස ලෙස නිවැරදි විය යුතුය. සටහන් අංක 4.2 හි ශීර්ෂය යතුරු ලියන දෝෂයක් හේතුවෙන් 2 වන කොටස, සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම ලෙස වැරදි ලෙස දක්වා ඇති අතර එය 1 වන අදියර, 1 වන කොටස ලෙස නිවැරදි විය යුතුය.<br><br>කෙසේ වෙතත්, මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ වාහන (අතිරේක හෙළිදරව් සටහන් අංක 2.1 යටතේ) නිවැරදිව දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල සුදුසු හෙළිදරව් කිරීම් කර යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ 3 වන කොටස විසින් භාවිතා කරන ලද අතර රු. මිලියන 57.3 ක් වටිනා වාහන පහක් සහ ව්‍යාපෘතියේ 2 වන කොටස විසින් භාවිතා කරන ලද මිලියන 25.7 ක් වටිනා එක් වාහනයක් 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂවලදී ලංවිම වෙත භාර දී ඇත. කෙසේ වෙතත්, ගිණුම් පොත්වලින් පැවරීමකින් තොරව එම වාහන ව්‍යාපෘතියේ දේපල, පිරියත සහ උපකරණ යටතේ තවදුරටත් ඇතුළත් කර තිබුණි. | 83 | වාහන සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන බැවින්, ණයදෙන ආයතනයේ අරමුදල් භාවිතා කිරීම අනාවරණය කිරීම සඳහා එය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, අමතර හෙළිදරව් කිරීම්වල 2 වන කොටසෙහි වාහනය අදාළ අංශයට මාරු කර ඇති බව දක්වා ඇති නමුත් ව්‍යාපෘති අංශයේ ලෙජරයෙන් මාරු කර නොමැත. | සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් යෙදීම හෝ අදාළ තොරතුරු හෙළිදරව් කිරීම. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ මුදල් බැංකු ගිණුමකට ලැබුණු රු. මිලියන 9.2 ක පොළිය, මූල්‍ය ප්‍රකාශනවල වෙනම අයිතමයක් ලෙස දැක්වීම වෙනුවට | 9.2 | අත්තිකාරම් අග්‍රිමය බැංකු ගිණුමේ පොලී ගලා ඒම ව්‍යාපෘති වියදම් ගෙවීම සඳහා ද යොදා ගැනීම නිසා විශේෂ විදේශ මුදල් බැංකු ගිණුමක් සඳහා ලැබෙන පොලිය ණය භාවිතය අඩු කරනු ඇත. | සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් යෙදීම. |

| | | | | |
|---|---|---|---|---|
| | ලංවිම ප්‍රාග්ධන දායකත්වයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ විශේෂ විදේශ මුදල් බැංකු ගිණුමකට ලැබුණු රු. මිලියන 3.4 ක පොළිය, එල්.කේ.ඒ.එස් 7 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස පෙන්වා නොතිබුණි. | 3.4 | අත්තිකාරම් අග්‍රිමය බැංකු ගිණුමේ පොලී ගලා ඒම ව්‍යාපෘති වියදම් ගෙවීම සඳහා ද යොදා ගැනීම නිසා විශේෂ විදේශ මුදල් බැංකු ගිණුමක් සඳහා ලැබෙන පොලිය ණය භාවිතය අඩු කරනු ඇත. | අදාළ තොරතුරු සමඟ සාධාරණ ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කිරීම. |
| (උ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ රජය විසින් දරන ලද පොලී, බැදීම් ගාස්තු යනාදී විවිධ ණය ගැනීමේ පිරිවැය, ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩවල කොටසක් වුවද, එම වියදම් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වී නොතිබුණි. | - | ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර මෙම ණය ගිවිසුම එළඹ ඇත. එබැවින්, මෙම ණය සඳහා අදාළ බැදීම් ගාස්තු සහ පොලී මුදල් අමාත්‍යාංශය විසින් ගෙවනු ලැබේ. | සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් යෙදීම හෝ අදාළ තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම. |
| (ඌ) | ණය ගිවිසුම් අංක 3146 යටතේ සමාලෝචිත වර්ෂය තුළදී ලද එකතුව රු. මිලියන 4.2 ක් වූ ණය ලැබීම් දෙකක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, එම ණය ලැබීම් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වී නොතිබුණි. | 4.2 | එය විදුලිබල මණ්ඩලයෙන් පිටත වෙනත් ආයතනයක් විසින් ලද ණය ලැබීම් බැවින්, නිසි ගනුදෙනු පදනමක් නොමැතිව එය ගිණුම්ගත කළ නොහැක. | එකී ණය ලැබීම් ව්‍යාපෘතියට අදාළ බව සහතික කර ඒ අනුව කටයුතු කිරීම. |
| (එ) | ක්ෂයවීම් ගිණුම්කරණයේදී ලංවිම සහ ව්‍යාපෘතිය ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. එබැවින් ලංවිම සහ ලංවිම යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණනයේදී විශ්වාසදායක ලෙස සැසඳිය නොහැක. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ වත්කම්වල ක්ෂයවලින් රු. මිලියන 21.7 ක් අඩු කර තිබුණි. | 21.7 | කෙරීගෙන යන වැඩ සහ ලංවිම දායකත්වයේ ශේෂය හා සසඳන විට ක්ෂයවල බලපෑම ප්‍රමාණාත්මක නොවන බව සලකන ලද බැවින්, අප පෙර කාල පරිච්ඡේද හෙළිදරව් කිරීම් සිදු කර නොමැත. | ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මෙන්ම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සඳහාද එකම ගිණුම්කරණ මූලධර්ම යොදා ගත යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ | ව්‍යාපෘතියේ ගනුදෙනු ලංවිම අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් වී නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ඇතුළුව සියලුම ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘති ආවරණය වන පරිදි විගණන සැලැස්මක් සකස් කර ඇත. මෙම | ව්‍යාපෘතියේ මෙහෙයුම් ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණක විසින් |

| | | | | |
|---|---|---|---|---|
| | විගණන චක්‍රලේඛය | | ව්‍යාපෘතියේ විගණන කටයුතු කඩිනමින් ආරම්භ කරනු ඇත. | ව්‍යාපෘතිය විගණනය කළ යුතුය. |
| (ආ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය. | අදාළ සේවකයින්ගේ වැටුප්වලින් අඩු කිරීමෙන් තොරව 2020 ඔක්තෝම්බර් දක්වා උපයන විට ගෙවන (PAYE) බද්ද සහ බදු මත බද්ද ලෙස ව්‍යාපෘතිය විසින් රු. මිලියන 47.8 ක් එහි සතු අරමුදල්වලින් ගෙවා තිබුණි. | 2020 ඔක්තෝබර් දක්වා පමණක් ලංවිම විසින් PAYE බදු දරා ඇත. මණ්ඩලය විසින් ගත් තීරණයට අනුව 2020 නොවැම්බර් මාසයේ සිට අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සේවකයින් විසින් දරන ලදි. | මණ්ඩලයේ තීරණ නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 23 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2016 හි 4.3 වගන්තිය | ප්‍රතිපාදනයට පටහැනිව, ලබා නොගත් නිවාඩු සඳහා දීමනා සහ ප්‍රසාද දීමනා ලෙස 2021 දෙසැම්බර් 31 දක්වා එකතුව රු. මිලියන 96.3 ක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | මෙය ලංවිම ප්‍රතිපත්තියට සහ සියලුම ලංවිම සේවකයින්ට අදාල මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුවේ. | චක්‍රලේඛයේ විධිවිධානයට අනුකූල වීම. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්යසාධනය<br>ප්‍රතිශතය | <br>ළඟා කරගෙන ඇති කාර්යසාධනය<br>ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| 1 වන කොටස - ජල විදුලි ජනනය සංවර්ධනය සහ විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම | (අ) මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම<br>i. ලොට් ඒ 1<br>ii. ලොට් ඒ 2<br>iii. ලොට් බී<br>iv. ලොට් 3<br>v. ලොට් සී | 100 | <br>70<br>23<br>10<br>69<br>100 | මෙම බලාගාරය 2019 ජූනි මාසයේදී නිම කිරීමට මුලින් සැලසුම් කර තිබූ අතර පසුව එය 2023 නොවැම්බර් දක්වා දීර්ඝ කර තිබුණි. තවද, ප්‍රධාන සිවිල් වැඩ (ලොට් ඒ2) සඳහා කොන්ත්‍රාත්තුව, ආරම්භක නිම කිරීමේ දිනයට පසු දිනයක් වූ 2019 සැප්තැම්බර් 04 දින ප්‍රදානය කර තිබුණි.<br><br>ලොට් ඒ1 සහ ලොට් ඒ2 හි උපදේශන සේවා (ලොට් 3) සඳහා කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝබර් 24 දින ප්‍රදානය කර තිබුණද, ලොට් ඒ1 සහ ලොට් ඒ2 | උපදේශන සේවාව ප්‍රසම්පාදනය ප්‍රමාද වීම, ලොට් ඒ2 සහ ලොට් බී ප්‍රසම්පාදනය ප්‍රමාද වීම, කොවිඩ් 19 වසංගතය, විශේෂයෙන් පිපිරවීම සඳහා පුපුරණ ද්‍රව්‍ය සීමා කිරීම, විදේශිකයන් සඳහා වීසා නිකුත් කිරීමේ ප්‍රමාදය, භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා නොමැතිකම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟය යන හේතු නිසා ව්‍යාපෘතිය ප්‍රමාද විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ආ) 0.5 km, 132 kv ආශ්‍රිත සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ඉදිකිරීම සහ ස්ථාපනය කිරීම | | | සඳහා කොන්ත්‍රාත්තුව පිළිවෙලින් 2018 මැයි සහ 2019 ඔක්තෝබර් මාසයේදී ප්‍රදානය කර තිබුණි.<br><br>මෙම වැඩ කොටස ව්‍යාපෘතියේ විෂය පථයෙන් බැහැර වූවක් බව අනාවරණය විය. | |
| 2 වන කොටස - සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ධාරිතාව වැඩි දියුණු කිරීම | i.ලොට් ඒ<br>ii.ලොට් බී 1<br>iii.ලොට් බී 2 | 100<br>100<br>100 | 99.6<br>97.5<br>100 | සියලුම ක්‍රියාකාරකම්වල ආරම්භක නිම කිරීමේ දිනය 2019 ජුනි වුවද, එය 2022 පෙබරවාරි දක්වා දීර්ඝ කර තිබුණි. | • පාස්කු ඉරිදා ප්‍රහාරය.<br>• අහිතකර කාලගුණික තත්ත්වය, උප කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටළු සහ පිරවීමේ ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා පනවන ලද සීමාවන්.<br>• කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සමස්ත ප්‍රමාදයන්. |
| 3 වන කොටස - මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | වව්නතිව් සහ මාදම්පේ අවට කිලෝමීටර් 92 ක පමණ දුරකින් 33kv මධ්‍යම වෝල්ටීයතා මාර්ග සහ ගැන්ට්‍රිස් ස්ථාපනය කිරීම. | 100 | 98.9 | 2020 පෙබරවාරි 25 දිනැති අංක 20.03.049 දරන මණ්ඩල සාකච්ඡා සටහන අනුව, ව්‍යාපෘතියේ මෙම කොටස නීති ගැටළු කිහිපයක් හේතුවෙන් අවසන් කර ඇති අතර ඉතිරි වැඩ කොටස ලංවිම බෙදාහැරීමේ අංශය, 02 වෙත භාර දී ඇත. | ඉඩම් නිරවුල් කිරීම් ප්‍රමාද වීම. |
| 4 වන කොටස - බලශක්ති කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා ඉල්ලුම් කළමනාකරණය | (අ) ස්මාර්ට් මීනුම් නියමු ව්‍යාපෘතිය<br><br>(ආ) තාප ගබඩා කිරීමේ නියමු ව්‍යාපෘතිය | 100<br><br>- | 100<br><br>- | ස්මාර්ට් මීනුම් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, නියමිත දින සිට මාස 11 ක් ගතවීමෙන් පසු එනම් 2019 ජූලි 29 දින අවසන් කර ඇත. තවද, තාප ගබඩා කිරීමේ නියමු ව්‍යාපෘතිය සහ ස්මාර්ට් ගොඩනැගිලි නියමු | - |

| | | | | |
|---|---|---|---|---|
| | (ඇ) ස්මාර්ට් ගොඩනැගිලි නියමු ව්‍යාපෘතිය | - | - | ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු පසුව ඉල්ලුම් කළමනාකරණ ව්‍යාපෘති සංකල්පය සම්බන්ධයෙන් ඇති වූ බාහිර පාරිසරික වෙනස්කම් හේතුවෙන් අවලංගු කර ඇත. |
| 5 වන කොටස - ධාරිතා සංවර්ධන සහාය සැපයීම | (අ) ආයතනික ධාරිතාව සඳහා උපදේශන සේවාව සැපයීම | - | - | මෙම උපදේශන සේවාව - ලබාදීම ආරම්භ කර නොතිබුණි. |
| | (ආ) දෙවන අදියර සඳහා නව ව්‍යාපෘතිවල ව්‍යාපෘති කළමනාකරණය සඳහා උපදේශන සේවාව සැපයීම. | 100 | 100 | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** ප්‍රමාද වීමට හේතු ලෙස දක්වා ඇති කරුණු

**විගණකගේ නිර්දේශයන්**

1 වන කොටස -අපේක්ෂිත අවසන් දිනය වන විට ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2 වන කොටස - දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාකාරකම් අපේක්ෂිත අවසන් දිනට නිම කිරීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.

3 වන කොටස - ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගත යුතුය.

4 වන කොටස - සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කර යුතුය.

5 වන කොටස - ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘති කොටස්වල අවශ්‍යතාවය හඳුනාගත යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහනේ ක්‍රියාකාරකම්වල වගකීම ලංවීම අතිරේක සාමාන්‍යාධිකාරීවරයාට පැවරීම වෙනුවට විවිධ අංශ ප්‍රධානීන්ට පැවරීම නිසා ව්‍යාපෘතියේ සම්බන්ධීකරණය සතුටුදායක මට්ටමක නොතිබුණි. | ව්‍යාපෘති අංශය සාමාන්‍යයෙන් ප්‍රධාන ජනන සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති පමණක් භාර ගන්නා අතර ව්‍යාපෘතියේ විෂය පථය තුළ යම් බෙදාහැරීමක් සම්බන්ධ කාර්යයක් තිබේ නම් එය අදාළ බෙදාහැරීමේ අංශය මගින් සිදු කරනු ලැබේ. | සැලසුම් කර ඇති පරිදි ඉතිරි ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා නිසි සම්බන්ධීකරණය සහතික කිරීම. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකුවේ ණයවල මුල් අවසන්වීමේ දිනය (ණය අංක 3146 සහ 3147) 2020 මාර්තු 31 වූ අතර එය 2021 | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ව්‍යාපෘතියේ 1 වන කොටස ඉදිකිරීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කිරීමයි. | අපේක්ෂිත අවසන් දිනය වන විට ඉතිරි ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට |

| | | |
|---|---|---|
| මාර්තු 30 දක්වා දීර්ඝ කර තිබුණි. අපේක්ෂිත ප්‍රගතිය ලඟා කර නොගැනීම හේතුවෙන් 2024 ජූලි 13 දක්වා තවදුරටත් දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම් වැඩි විය හැකි අතර නිදහස් නොකළ ණය ශේෂය සඳහා වැඩි බැඳීම් ගාස්තුවක් ගෙවීමට සිදුවේ. | ප්‍රමාදයට හේතු ඉහතින් දක්වා ඇත. මුල් නිම කිරීමේ දිනය ඉක්මවා කාලය දීර්ඝ කිරීම් ලබා දීමෙන් අමතර වියදම් දැරීමට සිදුවන බව සත්‍යක් වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදුන් කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ආනයනය කරන ලද වාහන 3 ක මුළු තථ්‍ය CIF වටිනාකම රු. මිලියන 8.9 කට සමාන එජඩො 58,446 ක් වුවද, ව්‍යාපෘතියේ 2 කොටසේ ලොට් බී2 හි ප්‍රමාණ පත්‍රයට අනුව එම වාහන 3 ආනයනය කිරීම සඳහා රු. මිලියන 24 කට සමාන එජඩො 158,065 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රමාණ පත්‍රයේ මුළු මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය විසින් වාහන මිලදී ගැනීමේදී රු. මිලියන 15.1 ක ආර්ථිකමය නොවන වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය. | මූලික ලංසු මිල, ලංසු අවස්ථාවේදී SCAPC අනුමැතිය සහිතව තීරණය කර ඇති අතර 2016 මැයි මාසයේදී අත්සන් කරන ලද ලොට් බී2 සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම අනුව එකඟ වූ කොන්ත්‍රාත්තු මිල ගෙවීමට ලංවිම බැඳී සිටින අතර 2017 දී වාහන ආනයනය කර ඇත. CIF අනුව වාහනයේ මිල සහ කොන්ත්‍රාත්කරු විසින් පිරිනමන ලද මිල වෙනස් වුවද, කොන්ත්‍රාත් ගිවිසුමේ ලංසු මිලට අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීමට ලංවිමට බැඳීමක් ඇත. | අනාගතයේදී අවශ්‍ය වත්කම් තථ්‍ය පිරිවැය මත සපයා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව පුරප්පාඩු 55 ක් තිබූ අතර ඉන් 6 ක් ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපා ඇත. | අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. | අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |